# පුවත් කළමණාකරණය ඔස්සේ ලැබෙන ආධිපත්‍යය

දැනුම් කළමණාකරණය කාහටත් හොඳින් පෙනෙන පරිදි ක්‍රියාත්මක වන්නේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයෙහි ය. ලෝකයේ සිදුවන පුවත් බෙදාහරිනු ලබන්නේ බටහිර සමාගම් කිහිපයක් මගිනි. බොහෝ දෙනා දන්නා රොයිටර්, බීබීසී, සීඑන්ඒ, ප්‍රංශ පුවත් සේවය ආදිය ඒ අතර වෙයි. ලංකාව වැනි රටවලට සිදුවන්නේ ඒ සමාගම් කිහිපය මගින් බෙදාහැරෙන ප්‍රවෘත්තිවලින් කොටසක් තම රුචිකත්වය අනුව තෝරාගෙන පළකිරීම ය.

ලංකාවේ වුව ද පුවත් කළමණාකරණයක් සිදුවන බව ඒ ඒ ජනමාධ්‍ය ඇසුරුකිරීමෙන් දැනගත හැකි වෙයි. ඒ ඒ ජනමාධ්‍ය ප්‍රධාන වශයෙන් ප්‍රචාරය කරන්නේ තම තමන්ට වාසිදායක ප්‍රවෘත්ති පමණ ය. ඊනියා මධ්‍යස්ථ භාවයක් පෙන්වීම සඳහා අනෙක් ප්‍රවෘත්ති ද ඇතැම්විට සුළු වශයෙන් ප්‍රචාරය කිරීමට ඇතැම් ජනමාධ්‍ය වගබලාගනු පෙනෙන්නට ඇති කරුණකි. එහෙත් ඒ ඒ ජනමාධ්‍ය වැඩි වශයෙන් ප්‍රචාරය කරන්නේ තමන් ප්‍රියකරන ප්‍රවෘත්ති බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ලංකාවේ ජනමාධ්‍යවලට ලංකාව සම්බන්ධ ප්‍රවෘත්ති තෝරාගැනීමේ නිදහසක් සාමාන්‍ය කාලවල දී තිබුණ ද ලෝක ප්‍රවෘත්ති තෝරාගැනීමේ දී ඒ නිදහස නැත. ලංකාව වැනි රටවල ජනමාධ්‍යවේදීන්ට ඒ ඒ රටවලට ගොස් ප්‍රවෘත්ති රැස්කරගැනීමේ හැකියාවක් නැත. එබැවින් ආසියාවේ අප්‍රිකාවේ හා දකුණු ඇමරිකාවේ ජනමමාධ්‍යවේදීන්ට පමණක් නොව ඇතැම්විට යුරෝපයේ ම සමහර රටවල ජනමාධ්‍යවේදීන්ට ද සමාගම් මගින් සපයන ප්‍රවෘත්ති මත යැපීමට සිදුවෙයි. අනෙක් අතට හදිසි නීති පැනවූ විට ප්‍රවෘත්ති සාමාන්‍ය කාලවල දී මෙන් සැඟවී නොව විවෘතව ම කළමණාකරණය වෙයි.

අපි උදාහරණයක් ලෙස ලංකාවේ ප්‍රවෘත්ති පිටරටවල ප්‍රචාරය වන ආකාරය ගනිමු. එහි දී බටහිර රටවල් ප්‍රචාරය කරන ප්‍රවෘත්තිවල පදනමේ ඇත්තේ ලංකාවේ වෙසෙන දෙමළ ජනයාට සිංහලයන්ගෙන් තදබල අසාධාරණයක් සිදුවන බව ය. ලංකාවට බටහිර රටවලින් එන වාර්තාකරුවන්ගෙන් සියයට අනූපහටත් වඩා විශාල පිරිසක් රටට පයගහන්නේ ම ඒ මතවාදය මනසෙහි රඳා ගනිමිනි. ඔවුන් ඉන්පසු තොරතුරු සොයන්නේ ද ඒ මතය තහවුරුකිරීමේ අරමුණෙන් ය. ඔවුන් ලංකාවේ දී වැඩි වශයෙන් මුණ ගැසෙන්නේ ද ඒ මතය දරාගත් මෙරට වැසියන් ය. ඒ වැසියෝ බොහෝ විට රාජ්‍ය නොවන සංවිධානවල සේවය කරන්නෝ වෙති.

මුළු ලෝකයට ම ඒ මතය වෙදා දී ඇත්තේ දෙමළ ජාතිවාදී පක්ෂ හා කණ්ඩායම් නොව බටහිර පුවත් ආයතන ය. දෙමළ ජාතිවාදීන්ට ලෝ පුරා එවැනි මතවාදයක් ප්‍රචාරය කිරීමේ හැකියාවක් ඇතැයි කිසිවකුවත් නොසිතිය යුතු ය. ඒ මතවාදය ලෝ පුරා ප්‍රචාරය කිරීමට බටහිරයන් වෙහෙසෙන්නේ ඒ ඔවුන්ට අවශ්‍ය මතවාදය වන බැවින් ය. එසේ නැතිව දෙමළ ජාතිවාදී මතය සාධාරණ නිසා බටහිර ජනමාධ්‍ය එසේ කරනවා නො වෙයි. බටහිරයන්ට ඒ මතවාදය අවශ්‍ය වන්නේ සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට පහර ගැසීමට ය.

ඉතාම ආසන්න සිද්ධියක් ගතහොත් බටහිර ජනමාධ්‍ය තමිල්සෙල්වන් ගැන ප්‍රචාරය කෙළේ ඔහු සාමයේ දූතයකු වීය යන අදහස ලෝකයට දීමට ය. බටහිරයෝ තමිල්සෙල්වන් ඝාතනය කිරීම සාමයට එල්ල කළ පහරක් ලෙස කියැවෙන ප්‍රවෘත්ති පළකළහ. එමගින් ඔවුන්ට අවශ්‍ය වූයේ ලංකාණ්ඩුව සාමයට විරුද්ධ බව පෙන්වීම ය. ඒ සමග කොටි සංවිධානය සාමයට ලැදිය යන මතය ද ප්‍රචාරය කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. එහෙත් බටහිර ජනමාධ්‍ය තමන්ට අවශ්‍ය සාමය කුමක් දැයි පැහැදිළි ව නො කියයි. ඔවුන්ගේ සාමයේ ඇත්තේ සන්ධීය, සහසන්ධීය රාජ්‍යයක් බව ඔවුහු නො කියති. කෙසේ වෙතත් තමිල්සෙල්වන් යනු මිනීමරුවකු බවත් ඔහු සැරයටියක් පාවිච්චි කෙළේ සාමය සඳහා දුවන්නට ගොස් කකුල කඩාගැනීම නිසා නොවන බවත් ඔහු ඉන්දියාවේ ද අවි පුහුණුව ලැබූවකු බවත් නොකීමට බටහිර ජනමාධ්‍ය ප්‍රවේසම් විය.

අනෙක් අතට බටහිර ජනමාධ්‍ය ද, කිසිදු විචාරයක් නොමැතිව ඒ අනුකරණය කරන ලංකාවේ ජනමාධ්‍ය ද, ලංකාණ්ඩුව ද තමිල්සෙල්වන් හැඳින්වූයේ කොටි සංවිධානයේ දේශපාලන අංශයේ නායකයා ලෙස ය. මෙයින් නොකියා

© Prof. Nalin De Silva

කියැවෙන්නේ කොටි සංවිධානයට ප්‍රහාරක අංශය හා දේශපාලන අංශය යනුවෙන් අංශ දෙකක් ඇති බවත් එකක නායකයා ප්‍රභාකරන් බවත් අනෙකෙහි නායකයා දැන් නම් නඩේසන් නම් තැනැත්තා බවත් ය. මෙය මුළු ලෝකය ම මුළාකිරීමට යොදාගන්නා උපක්‍රමයක් පමණකි. කොටි සංවිධානයට ඇත්තේ එක් නායකයකු හා එක් දේශපාලනයක් පමණ ය.

ඊනියා දේශපාලන අංශයෙහි නායකයා ප්‍රභාකරන් නොව වෙනත් අයකු යැයි කී විට ඉන් කියැවෙන්නේ කොටි සංවිධානයේ දේශපාලන තීන්දු වෙනත් අයකු විසින් ගනු ලබන බව ද? කොටි සංවිධානයෙහි දේශපාලන තීන්දු ද ගනු ලබන්නේ එහි නායකයා වූ ප්‍රභාකරන් විසින් මිස වෙනත් අයකු විසින් නො වේ. තමිල්සෙල්වන්ට පැවරී තිබුණු කාර්යය අන් කිසිවක් නොව ප්‍රභාකරන් හත් දේශපාලන තීන්දු වෙනුවෙන් පෙනී සිටීම පමණ ය. එසේ පෙනී සිටීමේ දී තමිල්සෙල්වන්ට සොල්හයිම් ආදීන්ගේ පූර්ණ සහාය ලැබුණු බව පැහැදිළි ය.

බටහිරයන් ප්‍රවෘත්ති පාලනය කිරීම මගින් ජනමතය හසුරුවන්නේ එසේ ය. ඔවුහු ලංකාව සම්බන්ධ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමේ දී ලෝක ජනමතය පමණක් නොව ලංකාවේ ජනමතය ද හසුරුවති. එසේ කිරීමට හැකි වී ඇත්තේ මෙරට ජනමාධ්‍යවලට ගුරුහුරුකම් බටහිරයන්ගෙන් ලැබීමත් මෙරට ජනමාධ්‍යවේදීන් බොහෝ දෙනකු ඊනියා ප්‍රබුද්ධයන් වීමත් නිසා ය. ප්‍රබුද්ධයන්ට තම ප්‍රබුද්ධටත්වය රැකගත හැක්කේ බටහිරයන් කියන දෙය රාව ප්‍රතිරාව කිරීමෙන් පමණකි. අද නඩේසන්ට කිව යුත්තේ කොටි සංවිධානයෙහි ඊනියා දේශපාලන අංශයක නායකයා කියා නොව ප්‍රභාකරන්ගේ දේශපාලනය වෙනුවෙන් පෙනී සිටින්නා කියා ය.

ලෝකයේ මධ්‍යස්ථ ජනමාධ්‍යයක් නැත. ඒ ඒ ජනමාධ්‍ය ඒ ඒ සංස්කෘතියට, චින්තනයට, දැනුමට, දේශපාලනයට, ආදී වශයෙන් පක්ෂපාති වෙයි. ලෝකයේ ප්‍රවෘත්ති කළමණාකරණය බටහිර රටවල සමාගම් කිහිපයක් අතින් සිදුවන විට ලෝකය පුරා ප්‍රචාරය වන්නේ කා හට අවශ්‍ය ප්‍රවෘත්ති ද යන්න සිතාගැනීම අපහසුවක් නො වෙයි. පසුගිය දා මියන්මාරයේ සිදු වූ සිද්ධි ප්‍රචාරය වූයේ එරට හමුදා ආණ්ඩුවට විරුද්ධ දෑ ලෙස ය. හමුදා ආණ්ඩුවේ දුර්වලකම් නැතිවා නො වෙයි. එහෙත් බටහිර ජනමාධ්‍ය ප්‍රවෘත්ති ප්‍රචාරය කරන්නේ, හමුදා ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවයක් ගැන ලෝකයාට කීමට ය.

බටහිර ප්‍රවාත්තිවලට අනුව අවුං සාන් සු කී මහත්මිය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැප වූ තැනැත්තියකි. ඇය තමිල්සෙල්වන්ගේ වර්ගයේ නොවූවත් සාමයේ දූතිකාවක් ලෙස හැඳින්වෙයි. බටහිරයන් විසින් ඇය නොබෙල් සාම ත්‍යාගයෙන් ද පුදනු ලැබුවා ය. පසුගිය දා භික්ෂූන් වහන්සේ ද වෙනත් අය ද හමුදා ආණ්ඩුවට විරුද්ධව පෙළපාලි ගියහ. බටහිර ජනමාධ්‍යවලට අනුව මේ පෙළපාළි ස්වේච්ඡාවෙන් කෙරුණු දෑ ය. එහෙත් තත්වය එසේ නො වේ. සු කී මහත්මිය බටහිරයන්ගේ අවශ්‍යතාවට කටයුතු කරන්නී ය. බ්‍රිතානි ජාතිකයකු සමග විවාහ වී ඒ රටෙහි පදිංචි වී සිටි ඇය ආපසු මියන්මාරයට ගියේ තම මවට උපස්ථාන කිරීමට යැයි කියා වුවත් ඇය මියන්මාරයට ගිය පසු දේශපාලනයෙහි නිරත වූවා ය.

පසුගිය දා ඇති වූ පෙළපාළි ස්වේච්ඡාවෙන් සිදු වූ දෑ නොව බටහිරයන්ගේ මෙහෙයුම් බව හෙළිදරවු වෙමින් පවතියි. බටහිර නිල ජනමාධ්‍යවලට බාහිර ව කටයුතු කරන ජනමාධ්‍යවේදීහු කිහිප දෙනෙක් වෙති. එවැන්නකු වූ විලියම් එංගදාල් මහතා විසින් රචිත ලිපියක් පසුගිය දා “දි අයිලන්ඩ්” පුවත්පතෙහි පළවිණි. ඒ ආශ්‍රයෙන් ලියැවුණු ලිපියක් පසුගිය දහඅට වැනි දා “ඉරිදා දිවයින” පුවත්පතෙහි මියන්මාරයෙහි භික්ෂු විප්ලවය යන මැයෙන් පළවිණි. ඒ ලිපියෙන් කියැවෙන්නේ නෙඩ් සංවිධානය, ජෝර්ජ් සොරොස් ඕපන් සොසයිටි ආයතනය, ෆ්‍රීඩම් ආයතනය, ජින් ෂාර්ප්ගේ ඇල්බට් අයින්ස්ටයින් ආයතනය ආදිය තිරය පිටුපස සිට මියන්මාර ජනතාව මෙහෙයවන ආකාරය ය.

බටහිරයන් ලෝකයේ ප්‍රවෘත්ති කළමණාකරණය කරන්නේ ඒ ආකාරයට ය. ඒ කළමණාකරණය ඔස්සේ ඔවුහු ලෝක ජනමතය තමන්ට අවශ්‍ය ලෙස සකස් කරති. එහෙත් බොහෝ දෙනා ඒ බව නො දනිති. මෙහි වඩාත් ම ඛෙදජනක කරුණ වනුයේ ඒ බව නොදන්නා පිරිස ඊනියා උගතුන් වීම ය. අද දවසේ උගතා යනු බටහිර දැනුම යම් ප්‍රමාණයකට හෝ ලබාගත් තැනැත්තෙකි. එවැනි උගතුන් බොහෝ විට දන්නේ තමන්ට බටහිරයන් උගන්වන දේ ය. ඊනියා විචාර

© Prof. Nalin De Silva

බුද්ධියක් ගැන කතාකළ ද, බටහිරයෝ තමන් කියන දේ ඉගෙන ගන්නා උගතුන්ට විචාර බුද්ධියක් ලබා දීමට කටයුතු නො කරති.
ඒ උගතුන්ට ලැබෙන විචාර බුද්ධිය ඉතා සීමිත වූවකි. සමස්ත පද්ධතිය ම විචාරයට හසුකිරීමට ඒ සීමිත විචාර බුද්ධියෙන් අවකාශයක් නො ලැබෙයි. පද්ධතිය තුළ සුළු කරුණක් විචාරයට හසුකළ හැකි වුව ද සමස්ත පද්ධතිය විචාරයට හසුකිරීමට ඉඩක් නැත. ඒ බව ඒ උගතුන්ට අවබෝධ නොවන තැනට කරුණු සලස්වා ඇත. බටහිර දැනුම් පද්ධතිය සකස් කෙරී ඇත්තේ ම පද්ධතියට ඊනියා වාස්තවිකත්වයක් ආරූඪ කරදෙමිනි. බටහිර දැනුම ලබාගත් ඊනියා උගත්තු එලෙස වාස්තවිකත්වයක් ඇතැයි විශ්වාස කරති. මනසින් ස්වායත්ත ව එවැනි වාස්තවිකත්වයක් ඇති බව පෙන්නුම් කිරීමට නොහැකිව තිබිය දී ඊනියා උගතුන්ට එසේ විශ්වාස කිරීමට වටපිටාව සකස් කර ඇත්තේ ඊනියා විචාර බුද්ධිය කුණු කූඩයට දමමිනි.

බටහිරයන් ප්‍රවෘත්ති කළමණාකරණය කරන්නේ අප වැනි රටවල් සඳහා පමණක් නො වෙයි. බටහිරයෝ  තම තමන්ගේ රටවල ද ප්‍රවෘත්ති කළමණාකරණය කරති. ඉරාක යුද්ධය සම්බන්ධයෙන් ඒ ඒ රටවල ජනතාව නොමග යැවීම සඳහා බටහිර නායකයෝ සත්‍යයට පළා යෑමට ඉඩ දුන්හ. එමගින් ඉරාක යුද්ධය සම්බන්ධයෙන් ප්‍රවෘත්ති කළමණාකරණය කිරීමට ඒ නායකයෝ සමත් වූහ. ඉරාක යුද්ධය පිළිබඳ ඇතැම් වාර්තාමය චිත්‍රපටි නිපදවා ඇත්තේ ඉරාකයේ නොව ඇමරිකා එක්සත් ජනපදයේ දී ම බව පැවසෙයි. එහෙත් ලෝක ජනතාව හෝ  ඇමරිකන් ජනතාව හෝ ඒ බව නො දනිති. බොහෝ දෙනා සිතන්නේ තාක්ෂණය දියුණුවත් ම ජනතාවට කරුණු සැඟවීමට ඇති ඉඩකඩ අඩුවන බව ය. එහෙත් ඒ එසේ නො වේ. තාක්ෂණය ගැන මිනිසුන්ගේ ඇති බැඳීම වැඩිවත් ම ඒ යොදා ගෙන ප්‍රවෘත්ති  හා සාධාරණ වශයෙන් දැනුම කළමණාකරණයට ඇති ඉඩකඩ වැඩි වී එමගින් ජනතාව මුළා කිරීමට හා මෙහෙයවීමට ජනමාධ්‍ය හසුරවන්නන්ට ඇති හැකියාව වැඩිවෙයි. එමගින් අවසාන වශයෙන් ගත්කල ජනමාධ්‍ය හසුරුවන්නන්ගේ ආධිපත්‍යය වැඩිවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva